


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පි (කම්බි අදින්නා)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** තොරතුරු තාක්ෂණ අංශයට අදාළ මෙවලම්, සියළු ආම්පන්න වල කාර්යක්ෂමතාව හා පූර්ව නඩත්තුව අදාළ අධීක්ෂණය නිළධාරීන් යටතේ පවත්වාගෙන යාම.

**රැකියාවේ වගකීම් :**

I ගුවන් තොටුපොල සන්නිවේදන ජාලයේ නඩත්තු කටයුතු කාර්යක්ෂමව හා අඛණ්ඩව පවත්වා ගෙන යාම.

II හදිසි හා විශේෂ අවස්ථාවලදී අධික්ෂණ නිළධාරීන් විසින් ලබාදෙන ලිඛිත හා වාචික උපදෙස් අනුව ක්‍රියාකිරීම.

III අවශ්‍ය අවස්ථාවකදී අධීක්ෂණ නිළධාරීන් විසින් ලබාදෙන අදාළ ලේඛන උපයෝගි කොටගෙන උපකරණ පරීක්ෂා කිරීම හා ඒවා නඩත්තු කිරීමේ හැකියාව.

1V තොරතුරු තාක්ෂණ අංශයට අයත් වර්තමාන ව්‍යාපෘති අළුතින් එකතු කිරීම් හා වැඩි දියුණු කිරීම් වලට අදාල කටයුතු වලට දායක වීම.

V ගුවන් තොටුපොල පරිශ්‍රය තුල පිහිටි සංනිවේදන හා විදුලි සංදේශ හා ඊට අදාල අනෙකුත් වැඩ කටයුතු ඉටු කල යුතු අතර එහිදී සිදුවන අනතුරු වලක්වා ගැනීම සඳහා ආරක්ෂන විධිවිධාන තරයේ පිළිපැදීම.

VI කාල සටහන් පරිදි සතිපතා කෙරෙන නඩත්තු කටයුතු හා හදිසි නඩත්තු කටයුතු විධිමත්ව සිදු කිරීම හා ඒවා සම්බන්ධ විධිමත් වාර්තා තබා ගැනීම.

VII මිනුම් උපකරණ හා මෙවලම් නිසි පරිදි පරිහරණය කිරීම හා ඒවායේ ආරක්ෂාව සහතික කිරීම.

02/-

**සුදුසුකම් :** (අ) සිවිල් ඇන්ඩ් ගිල්ඩ්ස් ටෙලිකොමියුනිකේෂන් තාක්ෂණික සහතිකයේ අවම වශයෙන් විෂයයන් 3ක් (පැරණි නිර්දේශය 1වන කොටස) සමත්ව සිටිය යුතුය.

**හෝ**

(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

සහ

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලාව කාලසිමාවද /පුහුණු කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :** තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යුතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2025 **ඔක්තෝබර් මස 27 වන දිනට** පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ඡායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ**
**කටුනායක**

Adv. : 05/10/2025